හද රීදවන මතක සුවඳ සහ අන්ධ හක්තිය -2

කලින් ලිපියේ සඳහන් කල පරිදි මෙහිදී මා අදහස් කරන්නේ රෝහිත මුණසිංහ සහෝදරයාගේ කාතියෙන් ඉදිරිපත් කර තිබෙන ඇතැම් මතකල්පිත කරුණු, විකෘති කිරීම් සහ අවලාද සම්බන්ධයෙන් කරුණු කිහිපයක් කෙටියෙන් ඉදිරිපත් කිරීමටයි.

අත් අඩංගුවේ සිටියදී ඝාතනයට ලක් වූ රෝහණ සහෝදරයාගේ බිරිඳ වන ශ්‍රීමතී (චිත්‍රාංගනී) සහෝදරිය ගැන ඔහු පවසන දේ දෙස මුලින්ම බලමු. අයත්, දරුවනුත් විදේශීය රටකට ගෙන්වා ගෙන රැක බලා ගැනීමට ජනතා විමුක්ති පෙරමුණේ විදේශීය ශාඛා විසින් සැලසුම් කොට තිබුණේ යැයි ඔහු පවසයි. ත්‍රිකුණාමලයේ නාවික හමුදා කඳවුරේ රඳවා සිටි ශ්‍රීමතී සහෝදරියත්, දරුවනුත් වෙනුවෙන් යමක් කල හැකිදැයි සොයා බැලීම සඳහා 1990 ගණන් වල මැද භාගයේදීත්, ඉන් පසුවත් අපි ඔවුන් හමුවෙන්නට ගියෙමු. ඕස්ට්‍රේලියාවේ සිට ආරක්ෂක අමාත්‍යංශයේ ඉහළ සිට පහළට තට්ටු කිරීමෙන් අනතුරුව, නාවික හමුදාපතිවරයාගේ කාරුණික අවසරය ලබා රාගම නාවික හමුදා සංකීර්ණය තුළදී ඔවුන් මුණ ගැසෙන්නට පළමු වරට අපට අවස්ථාව ලැබුණේය.

අපට දැන ගන්නට ලැබුණු කරුණු අනුව, ඔවුන්ට ඒ වන විට කිසිම කෙනෙකුගෙන් පිහිටක් ලැබී තිබුණේ නැත. ශ්‍රීමතී සහෝදරියගේ චන්ද්‍රා ප්‍රනාන්දු "සුදු අයියා" විසින් ඇයත්, දරුවනුත් එංගලන්තයට ගෙන්වා ගැනීමට සියළු කටයුතු සකස් කොට තිබුණද, ඔවුන් එහි යන්නට කැමති වී නැත. සුදු අයියා විසින් දේශපාලන වාසි ලබා ගැනීම සඳහා එංගලන්තයේදී ඇයත්, ඇයගේ දරුවනුත් පාවිච්චි කරනු ඇතැයි ඔවුහු බියට පත්ව සිටියහ. එංගලන්තයේදී කිසිවෙකුටත් එවැනි බලපෑමක් කිරීමට නොහැකි බව අපි දනිමු. එහෙත් ඇය සහ දරුවන් එවැන්නක් කිසිසේත් විශ්වාස කළේ නැත. එහිදී ඔවුන් සියළු දෙනාම සුදු අයියාගේ දේශපාලන සිරකරුවන් බවට පත්වෙනු ඇතැයි ඔවිනු කල්පනා කරන්නට ඇත. දශකයකට ආසන්න කාලයක් නාවික හමුදා සංකීර්ණයෙන් පිට ජීවිතයක් ගත කරන්නට අවස්ථාව නොලැබූ ඔවුන් එසේ කල්පනා කිරීම ගැන පුදුම විය යුතුද නැත. එහෙත් රජයේ වගකීම යටතේ ත්‍රිකුණාමලයේ නාවික හමුදාව බාරයේ තව දුරටත් ජීවත් වීම මැනවැයි ශ්‍රීමතී සහෝදරිය තීරණය කල බවට රෝහිත මුණසිංහ සහෝදරයා ඉදිරිපත් කර තිබෙන කරුණු අසම්පූර්ණය. ඒ මේ නිසාවෙනි.

එදා ඔවුන් මුලින්ම හමු වූ විටත්, අදට දැන ගන්නට තිබෙන අන්දමටත්, ලංකාවෙන් පිටත්ව ගොස් ජීවත් වන්නට අවස්ථාවක් ලදොත්, එසේ කිරීමට ඔවිනු තවමත් කැමැත්තෙන් සිටිති. එහෙත් නාමත් ඔවුනට එසේ පිට වී යාමට අවස්ථාවක් ලැබුණේ නැත. මෑත කාලයේදී අපට අසන්නට ලැබෙන පරිදි, රටේ සාමාන්‍ය සිවිල් වැසියන් මහා පරිමාණයෙන් ඝාතනයකට ලක් කරමින් මානව වර්ගයාට එරෙහිව අපරාධ කර තිබෙන අය නිල ලෙසත්, නොනිල ලෙසත් විදේශ ගමන් බලපත්‍ර සහ වීසා බලපත්‍ර සාදා ගෙන රටින් යන්නටත්, ආපසු එන්නටත් හැකියාව ලැබ සිටිති. මා අසා ඇති පරිදි, රෝහණ සහෝදරයා අත් අඩංගුවේ සිටියදී ඔහුව ඝාතනය කළ හමුදා නිළධාරීන් පවා අද ඕස්ට්‍රේලියාවේ සුව පහසුවෙන් පසු වෙති. එහෙත් එබඳු රටක, ශ්‍රීමතී සහෝදරිය සහ ඇගේ දරුවන්ට රටෙන් පිට වී යන්නට තරම්වත් අවස්ථාවක් නොලැබී යාම ගැන කිව හැක්කේ කුමක්ද?

එහෙත් අප ගැන ඇය තුළ තිබෙන දැඩි විශ්වාසය නිසා ඕස්ට්‍රේලියාවට පැමිණෙන්නට ඔවුහු බලවත් කැමැත්තක් දැක්වූහ. ඕස්ට්‍රේලියාවේ අප පදිංචිව සිටින ප්‍රදේශයට කෙසේ හෝ ඔවුන් ගෙන්වා ගැනීමට කටයුතු කරන ලෙස අප මුලින්ම හමු වූ අවස්ථාවේ ඇය මගෙන් ඉල්ලා සිටියා ය. ඒ අනුව අප නැවත ඕස්ට්‍රේලියාවට පැමිණි පසු, ඔවුන් මෙහි ගෙන්වා ගැනීමට විශාල උත්සාහයක් දැරුවෙමු. ඕස්ට්‍රේලියානු සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයේ සභාපතිනියව සිටි මාගුරි රිඩ් මහත්මියත්, ඕස්ට්‍රේලියාවෙහි එක්සත් ජාතීන්ගේ සංවිධානයෙහි ජාතික සභාපතිනියව සිටි සෙනෙට් සභික මාගුරි රෙනෝල්ඩ්ස් මහත්මියත්, සෙනෙට් සභික ගැරි හම්ෆ්රීස් මහතාත්, සරණාගතයන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහා කොමසාරිස්වරයාගේ දකුණු ආසියානු කලාපීය කාර්යාලයේ ස්ථානාධිපතිව සිටි ස්ටීවන් වුල්ෆ්සන් මහතාත්, ඕස්ට්‍රේලියානු ආගමන කටයුතු පිළිබඳ ඇමතිවරයාව සිටි පිලිප් රඩොක් මහතාත්, එම දෙපාර්තුමේන්තුවේ විධායක නිළධරයනුත් හමු වී මෙම ඉල්ලීමේ ඇති මානුෂික පදනම පිළිබඳව කොතෙකුත් කරුණු ඉදිරිපත් කලෙමු. මේ සම්බන්ධයෙන් රටේ ආගමන සහ රැකවරණ නීතිය තුළ කළ හැකි සියළු දේ කරන්නට ඕස්ට්‍රේලියානු බලධාරීහු පොරොන්දු වූහ.

එහෙත් මෙම උත්සාහය කණගාටුදායක ලෙස නිමාවට පත් වූයේ, සරණාගතයන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහා කොමසාරිස්වරයාගේ කාර්යාලයෙන් ඕස්ට්‍රේලියානු රජයට මෙම විෂය ගැන සපයා තිබුණු නිෂේධාත්මක වාර්තාවක් නිසාය. ලංකාවේ රජයෙන් හෝ එහි වෙනත් පාර්ශ්වයකින් හෝ ශ්‍රීමතී සහෝදරියට සහ ඇගේ දරුවන්ට තර්ජනයක් එල්ල වී තිබුණේ 1989-90 කාලයේදී පමණක් බව එම ලිපියෙන් පවසා තිබුණි. ඒ වන විට රජය ඔවුන්ට රැකවරණ ලබා දී තිබෙන බව ද එහි සඳහන් කොට තිබිණ. සරණාගතයන් පිළිබඳ ජාත්‍යන්තර නීතිය යටතේ ලංකාවේ සිට ඔවුන් අයදුම්පත් ඉදිරිපත් කළත්, එවැනි ඉල්ලීම් සළකා බලන්නට තරම්වත් එම නීතියෙන් ඉඩකඩක් නොමැති බවත් එම වාර්තාවෙන් තව දුරටත් දක්වා තිබුණි. ඕස්ට්‍රේලියානු ආගමන කටයුතු පිළිබඳ දෙපාර්තුමේන්තුවට යවන ලද එම වාර්තාවට සම්බන්ධ ලිපියක පිටපතක් මෙහි දක්වා ඇත.

UNITED NATIONS
HIGH COMMISSIONER FOR REFUGEES

NATIONS UNIES
HAUT COMMISSARIAT POUR LES REFUGIES

Regional Office for Australia, New Zealand, Papua New Guinea and the South Pacific

5, Terrigal Crescent, O'Malley
Canberra, ACT 2606, AUSTRALIA
Ph.61-2-6290 1300, Fax61-2-6290 1315
Email: auscan@unhcr.ch

Our Code: auscanmisc/legal/
Your Code:

11 September 2000

Dear

Thank you for your letter dated 22 August 2000 on behalf of Mrs Rohana Wijeweera and family.

As Mrs Wijeweera is a citizen of Sri Lanka who remains in her own country, she does not meet the definition of a refugee contained in the Convention relating to the Status of Refugees (1951). As such, she does not fall within the mandate of UNHCR and does not qualify for resettlement under UNHCR auspices.

As the grant of asylum is the sovereign prerogative of individual governments, I have taken the liberty of copying our correspondence to the Department of Immigration and Multicultural Affairs, the government agency responsible for asylum matters in Australia.

Yours truly,

Steven Wolfson
Officer-in-Charge

cc: Department of Immigration and Multicultural Affairs
The UNHCR Chief of Mission in Sri Lanka
Mr Lionel Bopage

කරුණු දෙකක් ගැන සළකා බලන්නට එම නිළධාරීහු ඉන් පසුවත් සූදානම්ව සිටියහ. පළමුව, ශ්‍රීමතී සහෝදරිය ඉදිරියේදී අනතුරට පාත්‍ර විය හැකි කාන්තාවක් (A woman at risk) ලෙස සළකා විදේශයක පදිංචි කල හැකිදැයි සළකා බැලීමයි. දෙවැනිව, ඇයට විදේශීය රටකට යා හැකි නම්, එහිදී සරණාගතයෙකු ලෙස පිලි ගන්නා මෙන් අයදුම් පතක් ඉදිරිපත් කළහොත් ඒ ගැන සළකා බැලීමයි. තරමක හෝ ප්‍රායෝගික වලංගු භාවයක් තිබුණේ දෙවැනි කරුණේ පමණි. එහෙත් තනිවම දරුවන් සමග වෙනත් රටකට යන්නට තරම් මානසික සුවයක් ඇයට නොමැති බවයි අපට දැන ගන්නට ලැබුණේ. වෙනත් රටකට ටික කලකට හෝ පහසුකම් සහිතව යන්නට සැලසුම් කළත් ඇය එසේ යන්නට කැමති වූයේ නැත.

රෝහණ - චිත්‍රාංගනී විවාහ වූ දා

එහෙත් අප ගැන ඇය තුළ තිබෙන දැඩි විශ්වාසය නිසා ඕස්ට්‍රේලියාවට පැමිණෙන්නට ඔවුහු බලවත් කැමැත්තක් දැක්වූහ. ඕස්ට්‍රේලියාවේ අප පදිංචිව සිටින ප්‍රදේශයට කෙසේ හෝ ඔවුන් ගෙන්වා ගැනීමට කටයුතු කරන ලෙස අප මුලින්ම හමු වූ අවස්ථාවේ ඇය මගෙන් ඉල්ලා සිටියා ය. ඒ අනුව අප නැවත ඕස්ට්‍රේලියාවට පැමිණි පසු, ඔවුන් මෙහි ගෙන්වා ගැනීමට විශාල උත්සාහයක් දැරුවෙමු.

මෙම තත්වයෙන් එහාට ගමන් කිරීම සඳහා වෙනත් ආකාරයේ විකල්ප නීත්‍යානුකූල ක්‍රියා මාර්ගයක් සොයා ගැනීමට අපට නොහැකි විය. සරණාගතයන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහා කොමසාරිස් කාර්යාලයෙන් ඕස්ට්‍රේලියානු රජයට ඉදිරිපත් කරන ලද වාර්තාවෙන් පසුව වුවද, ඕස්ට්‍රේලියානු ආගමන කටයුතු පිළිබඳ දෙපාර්තුමේන්තුවේ විධායක නිළධාරීවරු මෙම කරුණ ගැන සානුකම්පිකව සළකා බැලූ බව ඔවුන්ට ගරු කිරීමක් වශයෙන් මා මෙහි සඳහන් කළ යුතුව ඇත. ඕස්ට්‍රේලියානු රජය වෙත ශ්‍රීමතී සහෝදරිය විසින් කරනු ලබන ආයාචනයකට සහයෝගය පළ කරමින් කරුණු ඉදිරිපත් කිරීමට සූදානම්ව සිටි ලංකාවේ බොහෝ දෙනෙකුටද මා මෙහිදී මගේ අවංක ස්තූතිය පිළිගන්වන්නෙමි.

මා දන්නා පරිදි මෙයින් වසරකට පමණ පසුව, ලංකාවේ ස්ට්‍රිට්සර්ලන්ත තානාපති කාර්යාලය විසින් ශ්‍රීමතී සහෝදරිය සම්මුඛ සාකච්ඡාවකට කැඳවා තිබුණි. ඇයත්, ඇයගේ පවුලේ සමහර දෙනාත් මේ සම්බන්ධයෙන් අපෙන් උපදෙස් ඉල්ලා සිටියහ. එම සාකච්ඡාවට අනිවාර්යයෙන් සහභාගී වන ලෙස අපි ඇයට කියා සිටියෙමු. ස්ට්‍රිට්සර්ලන්තය වැනි නන්නාඳුනන දේශයකට අළුතින්ම ගොස් තනිවම ජීවත් වීමට වේ යැයි යන බියෙන් ඔවිනු එම සම්මුඛ සාකච්ඡාවට සහභාගී නොවන්නට මුලින් අදහස් කර ගෙන සිටියද, පසුව ඊට සහභාගී වූ බව අපට දැන ගන්නට ලැබුණි. එහෙත් සරණාගතයන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහා කොමසාරිස් කාර්යාලයෙන් ඉදිරිපත් කරන ලද අදහසට සමාන අන්දමේ කරුණු ඉදිරිපත් කොට, ස්ට්‍රිට්සර්ලන්තය විසින් ඔවුන්ගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කරන ලද බවද දැන ගන්නට ලැබුණි.

2000 මුල් භාගයේදී රාගම නාවික හමුදා කඳවුරෙහි දී අපි නැවතත් ඔවුන් හමු වූයෙමු. මීට පසු කාලයකදී චන්ද්‍රිකා කුමාරතුංග බණ්ඩාරනායක ජනාධිපතිතුමියගේ ආණ්ඩුවේ ඇමතිවරයෙකුව සිටි වර්තමාන මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාත්, එම ආණ්ඩුවේම සිටි මහින්ද විජේසේකර ඇමතිවරයාත් ඔවුන්ට ආධාර උපකාර කොට තිබුණ බවත්, ජනතා විමුක්ති පෙරමුණෙන්ද මූල්‍ය සහ වෙනත් ආධාර සපයා තිබුණු බවත් අපට ආරංචි විය. රජයේ ඇමතිවරු විසින්ද අය සහ ඇගේ දරුවන් ඕස්ට්‍රේලියාවට එවන්නට අවශ්‍ය සියළු කටයුතු සූදානම් කර දෙන බවට පොරොන්දු වුණ බවද අපට දැන ගන්නට ලැබුණි.

ඔවුන් ඕස්ට්‍රේලියාවට ගෙන්වා ගන්නැයි කරන ඉල්ලීම් අපට තව දුරටත් ඉටු කළ නොහැකි වූ බැවිනුත්, රාජ්‍ය බලය දැරූ වගකිව යුතු කොටසක් විසින් ඔවුන්ට ආධාර කරන්නට

ලියුවිකරු සමග විජේවීර පවුලේ අය

පොරොන්දු වී තිබුණ බැවිනුත් ඉන් පසුව ඔවුන් හමු වන්නට මම විශේෂ උත්සාහයක් නොගත්තෙමි. එහෙත් මීට වසර කිහිපයකට පෙරදීද ඔවුන් ඕස්ට්‍රේලියාවට ඒමට හැකිදැයි සොයා බලන්නට උත්සාහ දැරූ බව දැන ගන්නට ලැබුණි. මේ අනුව ගත් විට රෝහිත මුණසිංහ සහෝදරයා කර තිබෙන රජයේ වගකීම යටතේ ත්‍රිකුණාමලයේ නාවික හමුදාව බාරයේ තව දුරටත් ජීවත් වීම මැනවැයි චිත්‍රාංගනී විජේවීර තීරණය කළායි යන ප්‍රකාශය ඉතාමත් අසම්පූර්ණ ලෙසත්, පදනම් විරහිතවත්, නොමග යවන සුළු ලෙසත් ඉදිරිපත් කරන ලද්දක් බව පැහැදිලිය. ඔපාදූප කිහිපයක් පමණක් පදනම් කර ගනිමින් ප්‍රබන්ධනය කල කථාවක් සත්‍යයයි පෙන්වන අයුරින් ඉදිරිපත් කිරීමට මුණසිංහ සහෝදරයාට මනා දක්ෂතාවයක් ඇති බව නම් ඉහත කී කරුණු අනුව පෙනී යයි.

ශ්‍රීමතී සහෝදරියගේ කතාව අවසන් කරන්නට පෙර තවත් කරුණක් කිව යුතුව තිබේ. ඒ රෝහිත මුණසිංහ සහෝදරයා ගැහැණු අය ගැන විශ්වසීය ආකාරයෙන් කර තිබෙන ඊනියා දේශපාලන විග්‍රහය ගැනයි.

ඉදිරි කලාපයට...

ලයනල් බෝපගේ